# ලෝකාලෝකය

## 2025 දෙසැම්බර් - 2026 පෙබරවාරි කලාපය

මක්නිසාද අපට ළදරුවෙක් උපන්නේය,
අපට පුත්‍රයෙක් දෙනලද්දේය,
ආණ්ඩුවද උන්වහන්සේගේ කර පිට තිබෙන්නේය.
උන්වහන්සේ අපූර්වය, මන්ත්‍රීවරයාය,
පරාක්‍රමවත් දෙවියන්වහන්සේය, සදාකාල පියාණෝය,
සමාදානයේ කුමාරයා යයි කියනු ලබන්නේය.
(යෙසායා 9 : 6)

ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය
අංක - 07, විවේකානන්ද පාර, වැල්ලවත්ත, කොළඹ 06.
දුරකථන අංක : 011 2581901




# හොඳම තෑග්ග

පුංචි දුවේ පුතේ, ඔන්න මේ අවුරුද්දෙත් අවසාන මාසයට අපි ඇවිල්ලයි ඉන්නේ. ඉතිං ඔයාල මේ ළඟ ළඟියේ සූදානම් වෙන්නේ ළඟ ළඟම එන අසිරිමත් නත්තල සමරන්නයි. මම දන්නවා පුංචි ඔයාලගේ සිත් වල පිරිලා තිබෙන සතුට කොයිතරම්ද කියලා. තෑගි බෝග ලබා ගන්න, නෑගම් යන්න, ලස්සන ඇඳුම් අඳින්න, නත්තල් ගීත ගායනා කරන්න සහ තවත් එවැනි ප්‍රීතිමත් දේවල් කරන්න ඔයාලා බලාගෙන ඉන්නේ. ඉතිං මම ප්‍රාර්ථනා කරනවා පුංචි ඔයාලට සුභම සුභ සහ දෙවියන්වහන්සේගේ ආශිර්වාදය පිරුණු නත්තලක් වේවා කියලා.

අද මම ඔයාලට කියන්න යන්නේ දෙවියන්වහන්සේ පිළිතුරු දෙනකම් විශ්වාසවන්තව බලා සිටි පුංචි දරුවෙකු පිළිබඳවයි.

ඔන්න එක ගමක සිටියා පුංචි පවුලක්. මේ පවුලේ සිටියේ අම්මා, තාත්තා සහ පුංචි පුතෙක්. මේ තාත්තගේ රැකියාව වුණේ බෝට්ටුවක නැගලා මුහුදට ගොස් මාලු ඇල්ලීමයි. ඉතිං ඔහුට ලොකු මුදලක් අතට නොලැබුනත් ලැබුනු පොඩි මුදලින් ඔවුන් සතුටින් ජීවත් වුණා. දෙසැම්බර් මාසය ආරම්භ වුනාම මේ තාත්තා පුතාට කතා කරලා කිව්වා "පුතේ, මම ඔයාට මේ නත්තලට ලස්සන ඇඳුමක් සහ රස කැවිලි අරන් දෙන්නම්" කියලා. ඉතිං මේ පුතා නත්තල් දවස ළං වෙනකම් ඇඟිලි ගැන ගැන සිටියා. ඔය අතරේ තාත්තා සුපුරුදු පරිදි මුහුදු ගියා. ඉතිං හැමදාම වගේ තාත්තා මුහුදු ගිහින් එන වෙලාවට මේ පුතා මුහුද අයිනට ගිහින් බලා සිටියා තාත්තා එනකම්. අනේ, ඒත් එදානම් වෙනදා වේලාවට තාත්තා අවේ නෑ. එදා මුහුදේ මහා කුණාටුවක් තිබුණා. පුතා ගොඩක් රෑ වෙනකල් බලාගෙන සිටියා. ඒත් තාත්තා ආවේ නෑ. පහුවෙනිදාත් බලාගෙන සිටියා තාත්තා ආවේ නෑ. මේ විදිහට දින ගණන් සති ගණන් පහු වුණා. අම්මයි මේ පුංචි පුතයි දැන් ගොඩක් අසරණ වුණා. කෑමටවත් යමක් ඔවුන් සොයාගත්තේ හරිම අමාරුවෙන්. ඒ වුනත් මේ පුතා අම්මට කරදර කළේ නෑ. නත්තල් දවස උදා වුණා. තාත්තා ආවේ නෑ. පුංචි පුතාට දුක හිතුනත් එයා එය ඉවසගෙන අම්මත් එක්ක සභාවට ගියා. දේව වචනය ඇසුවා. යාච්ඤා කළා. ඔවුන් ගෙදර යන්න හදද්දි දේවගැති තුමා ඔවුන්ට කතා කරලා කිව්වා දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කරන්න. දෙවියන්වහන්සේට පුළුවන් ඔබේ පියා ආරක්ෂා කර ගෙදර ගෙනෙන්න කියලා. අම්මට ඒ ගැන විශ්වාසයක් නොතිබුනත් මේ පුංචි දරුවා මේ වචන ගැන මෙනෙහි කරමින්, විශ්වාස කරමින් ගෙදර ගියා. ඔහු යාච්ඤා කළා. ඒ වගේම හැමදාම හවසට මුහුද අයිනට ගිහින් බලාගෙන සිටියා. ඔහුට පුදුම විශ්වාසයක් තිබුනා මගේ තාත්තව ගෙදර ගෙනත් දෙන්න දෙවියන්වහන්සේට පුළුවන් බව. කාලය ගත වුණා. දරුවා කිසිසේත්ම ඔහුගේ විශ්වාසය හා බලාපොරොත්තුව නැති කර ගත්තේ නෑ. ඔහු හැමදාම යාච්ඤා කළා. දවසක් හැන්දෑවක, ඔහුට මුහුදු වෙරළේ ඈත සුපුරුදු මුහුණක් පෙනෙන්න ගත්තා. ඔහු තව ටිකක් බලාගෙන සිටියා. ඔව්, කාලයක් ඔහු බලා සිටි ඔහුගේ තාත්තා. පුතා දුවගෙන තාත්තා ළඟට ගියා. ඔහු තාත්තව බදාගෙන සතුටු කඳුළු වගුරුවමින් ප්‍රීති වුණා. ඔහු කෑ ගහලා දෙවියන්වහන්සේට ස්තූති කළා. ඔහු කීවා, "තාත්තේ ඔයා තමයි මේ අවුරුද්දේ මගේ හොඳම නත්තල් තෑග්ග" කියමින් තව තවත් තාත්තට තුරුළු වුනා.

ඉතින් දුවේ පුතේ, ඔයාලා දැක්කා නේද ඒ පුංචි දරුවාගේ විශ්වාසය හා යාච්ඤාවට දෙවියන්වහන්සේ පිළිතුරු දුන් ආකාරය. ශුද්ධ බයිබලයේ යෙරමියා 33:3 මෙසේ සඳහන් වෙනවා. **(මට යාච්ඤා කරපන්න. එවිට මම නුඹට උත්තර දී නුඹ නොදන්නා මහත් වූ අමාරු දේ නුඹට පෙන්වන්නේමි - යෙරමියා 33:3**). පුංචි අපිත් මේ නත්තලේදී ප්‍රීති වන අතරම වැඩි වැඩියෙන් බයිබලය කියවන්න, යාච්ඤා කරන්න, දේව වචනයට කීකරු වෙන්න ඉගෙන ගනිමු. අපි අපේ කාරණා ගැන පමණක් නොව ලෝකයේ පුරාම සිටින සියළු මනුෂ්‍යයන් ගැන යාච්ඤා කරමු. ඒ අයගේ ගැළවීම උදෙසා, අවශ්‍යතාවයන් උදෙසා යාච්ඤා කරමු. දෙවියන්වහන්සේම මේ සඳහා ඔයාලට උපකාර කරන සේක්වා. දෙවියන්වහන්සේගේ ආශිර්වාදය, කරුණාව හා ප්‍රේමය පිරි සුභම සුභ අලුත් අවුරුද්දක් හා ප්‍රීතිමත් නත්තලක් වේවා!

**- තබීතා නැන්දා -**

# උපත සැමරීම

**"අන්ධකාරයෙහි ඇවිද්දා වූ සෙනඟ මහත් ආලෝකයක් දුටුවෝය. මරණ සෙවණ ඇති දේශයේහි විසූ අය කෙරෙහි එළියක් බැබළුණේය" (යෙසායා 9 : 2).**



ඔබ සැමට සුභ නත්තලක් වේවා. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උපත සමරන විට, නත්තලේ සැබෑ අරුත මතක තබා ගනිමු. උන්වහන්සේ මාංශවත් වී මේ ලොවට පැමිණීම, උන්වහන්සේගේ මෙලොව ජීවිතය, කුරුසිය මත ජීවිත පූජාව, සොහොන් ගෙයක තැන්පත් කිරීම, මරණින් නැවත නැගිටීම නත්තලේදී අප සැමරිය යුතුය. යේසුස්වහන්සේ මෙලොවට පැමිණියේ පව්කාර මනුෂ්‍යයන්ට දෙවියන්වහන්සේගේ ප්‍රේමය ප්‍රකාශ කිරීමටත් දැන්වීමටත්ය. බලාපොරොත්තුවක් නැති වූවන්ට බලාපොරොත්තුවක් ගෙනදීමටත් සදාකාල විනාශයට නියමව සිටි මනුෂ්‍ය සංහතියට ගැලවීම ගෙන ඒමටත්ය.

උන්වහන්සේගේ ජීවිතය අපට ආදර්ශමත් වේවා. එමෙන්ම උන්වහන්සේ අනු ගමනය කිරීම අපට ආශිර්වාදයක් වේවා. උන්වහන්සේගේ මරණය සහ නැවත නැගිටීම අපට ජයග්‍රාහී ලෙස ජීවත් වීමට බලය ලබා දෙන අතර උන්වහන්සේගේ නැවත පැමිණීම අපට ප්‍රීතිමත් අපේක්ෂාවක් ලබා දෙයි. අපගේ ස්වාමීන්වහන්සේගේ උපත සමරන විට උන්වහන්සේ අපගේ ජීවිත කෙරෙහි ඇති කළ ගැඹුරු බලපෑම අපි සිහිකරමු.

ගව ලෙනක ඉපදී අන්ධකාරයෙන් පිරුණු ලෝකයකට නොහොත් මනුෂ්‍ය ජීවිත වලට බලාපොරොත්තුව හා ආලෝකය ගෙනා සේක. උන්වහන්සේගේ ජීවිතය පුරාවටම ප්‍රේමය, බලය, අනුකම්පාව, සමාව දීම වැනි මහඟු ගුණාංග ප්‍රදර්ශනය කළ සේක. උන්වහන්සේගේ ජීවිතය ගැන මෙනෙහි කරන කල උන්වහන්සේගේ කුරුසිපත් වීම නොහොත් තම ජීවිතය ස්ව කැමැත්තෙන් පූජා කිරීම ඉතාම වැදගත් සිදුවීම ලෙස හැඳින්විය හැකිය. උන්වහන්සේගේ මරණය මඟින් අපගේ පාපය උදෙසා වන්දි ගෙවීමක් වූ අතර මනුෂ්‍යයා කෙරෙහි ඇති දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ ප්‍රදර්ශනයකි. එපමණක්ද නොව තුන්වැනි දිනයේදී උන්වහන්සේ මළවුන්ගෙන් උත්තාන වී පාපය සහ මරණය එක් වරක් පරාජය කොට සදහටම ජයගත් සේක. මේ තේජාන්විත මරණයෙන් නැවත නැගිටීම අපගේ ඇදහිල්ලේ පදනම වන අතර එය අපට සදාකාල ජීවනයේ බලාපොරොත්තුව ලබා දෙයි. එපමණක්ද නොව උන්වහන්සේ තම සභාව උදෙසා නැවත පැමිණෙන තෙක් බලා සිටීමේ අනාගතය පිළිබඳ ප්‍රීතිමත් අපේක්ෂාවක් ලබා දෙයි. අපි යම් දිනෙක උන්වහන්සේ සමඟ උන්වහන්සේට සමානව තේජස් ශරීර වලට මාරු වන බව අපි ඇදහිල්ලෙන් සිහි කරමු. එතෙක් අප අවට සිදු වන සිදුවීම් හෝ වාතාවරණයන් හෝ

මගින් කම්පා නොවී අධෛර්යමත් නොවී උන්වහන්සේට ගෞරවය ගෙන දෙන ජීවිත ගත කිරීමට උත්සහ කරමු. අප අවට සිටින අයට යේසුස්වහන්සේගේ ප්‍රේමය, කරුණාව, අනුකම්පාව, සමාව දීම සහ සුවය පතුරවමින් උන්වහන්සේගේ සුභාරංචිය එකිනෙකාගේ හදවත් වලට ළඟා කරමු. බලාපොරොත්තුවක්, අරමුණක්, ජීවත් වීමට ආශාවක් නොමැති අය වෙත මළවුන්ගෙන් නැවත නැගිට සිටින යේසුස්වහන්සේ පිළිබඳව හා සදාකාලික වූ දෙවියන්වහන්සේගේ ප්‍රේමය පිළිබඳව සුභාරංචිය ගැන මෙනෙහි කිරීමට, කතා කිරීමට අන් අය සමඟ බෙදා ගැනීමට ශුද්ධාත්මයාණන් වහන්සේ අපට අභිප්‍රේරණයක් ලබා දෙත්වා !

**"මක්නිසාද ස්වකීය ඒකජාතික පුත්‍රයාණන් දෙන තරම් ලෝකයට ප්‍රේම කළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සෑම දෙනාම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය" (යොහාන් 3 : 16).**

අපි නත්තල සමරන විට මතක තබා ගත යුතු ප්‍රධානතම කාරණය නම් දෙවියන්වහන්සේගේ ප්‍රේමයයි. දෙවියන්වහන්සේ ඔබටත් මටත් නොවෙනස් වන්නා වූ ප්‍රේමයකින් ප්‍රේම කරන බව නත්තලේ පණිවිඩයයි. පාපයේ කුලිය මරණය නොහොත් විනාශය ලෙස තිබියදී උන්වහන්සේගේ පුත්‍ර වූ යේසුස්වහන්සේ කරණකොටගෙන සදාකාල ජීවනය නොහොත් අමා මහ සැපත පව්කාර මනුෂ්‍යයා වෙතට ගෙන ආ සේක. අන්ධකාරයේ ඇවිදිමින් සිටි සෙනඟට මහත් ආලෝකයක් උදාකර දුන් සේක. විනිශ්චයට සහ දඬුවමට නියමව සිටි මනුෂ්‍ය සංහතියට සමාව සහ නිදහස යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන ගෙන දුන් සේක. කාලකණ්ණිකම වෙනුවට නැවුම් සහ අලුත් අරමුණු සහිත ජීවිතයක් මනුෂ්‍යයාට පෙන්වා දුන් සේක.

**"යමෙක් ක්‍රිස්තුස් වහන්සේ තුළ සිටින්නේද ඔහු අලුත් මැවිල්ලක්ය. පරණ දේ පහව ගියේය. මෙන්න සියල්ල අලුත් වී තිබේ" (2 කොරින්ති 5:17).**

ස්වාමී වූ යේසුස්වහන්සේගේ උප්පත්තිය සමරන විට අප කළ යුත්තේ කුමක්ද? අපේ පව් ගැන සමාව ලබා ගන්න. අපි අපේ පව් පාපොච්චාරණය කර උන්වහන්සේට පව් කියා දී සමාව ලබා ගන්න. මෙතෙක් කළ සියලු පව් අත් අරින්න. (**1 යොහාන් 1 : 9**) අපි අවංක ලෙස පසුතැවිලි වන විට උන්වහන්සේ අපේ පව් කමා කරන සේක.

දෙවියන්වහන්සේ සමඟ සම්බන්ධතාවය අලුත් කරගන්න. දිනපතා දේව වචනය කියවීම, උන්වහන්සේට කතා කිරීම, ප්‍රශංසාව සහ නමස්කාරය වැනි ක්‍රියාවල දිනපතා යෙදෙන්න.

එකිනෙකාට සමාව දෙන්න. එකිනෙකාගෙන් සමාව ගන්න. **"දෙවියන්වහන්සේගේ රාජ්‍යයත් ධර්මිෂ්ඨ කමත් සොයන්න" (මතෙව් 6:33).** ඔබ ලෝකයේ ආලෝකය ලෙස නොහොත් නුඹ සිටින සියලු තැන් හී දෙවියන්වහන්සේගේ දරුවකු ලෙස සාක්ෂියක් සහිතව ජීවත් වන්න. (**මතෙව් 5:14**) එකිනෙකා කෙරෙහි ප්‍රේමයෙන්, සහකම්පනයෙන් ක්‍රියා කරන්න **(යොහාන් 5:12).**


ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රීතියෙන්, ප්‍රේමයෙන් සහ සමාදානයෙන් ඔබේ හදවත් පිරේවා. දෙවියන්වහන්සේ ඔබ සැමට ආශිර්වාද කරන සේක්වා !

- සංස්කාරක -

**එස්. මෙත්තානන්ද**

**077 8813197**

# ඇමරිකාව බයිබලීය අනාවැකි ඇසින්



අද දවසේ අප ඇමරිකා එක්සත් ජනපදය බයිබලීය ඇසින් විමසා බලමු. බයිබලය දේවානුභාවයෙන් දුන් ලියවිල්ලක් හැටියට බයිබලය ගැන ශුද්ධ වූ බයිබලය ම සාක්ෂි දරයි. එය **2 තිමෝති 3 : 16 - 17** හි සඳහන් වේ. මේ නිසා බයිබලයෙහි සඳහන් සෑම තොරතුරක්ම සත්‍ය බව අප තරයේ විශ්වාස කරන්නකි. දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ලෙහි රටවල් පිළිබඳව ඒවායේ අනාගතය පිළිබඳව අනාවැකි ගණනාවක්ම සඳහන් වේ. එම අනාවැකි ඊශ්‍රායල් ජාතිය හා බැඳුණු අනාවැකි බව විශේෂ කරුණකි. යම් යම් රාජ්‍යයන් ඊශ්‍රායලය සමඟ ඇති සම්බන්ධතාවය, ඊශ්‍රායෙලය සමඟ ඇති කරගත් ගැටුම් නිසා එය විස්තර කිරීමේදී එම රාජ්‍යයන් ගැන අනාවැකි ලෙස ශුද්ධ වූ බයිබලයේ ඇතුළත් වේ. මෙලෙස අනාගතයට අදාළ වූ අනාවැකි ගණනාවක් ඇති බව අපට දැක ගත හැකිය. උපහැරණයක් ලෙස වර්තමානයේ ඇතිවූ ඊශ්‍රායෙල් ඉරාන මහා ගැටුමයි. බයිබලයෙහි ඉරානය ගැන පමණක් නොව තවත් බොහෝ රටවල් අදත් අපට හඳුනාගත හැකි ලෙස සඳහන් වේ. ඊශ්‍රායෙල් රටට අමතර ව මිසරය නොහොත් ඊජිප්තු රට ගැන බයිබලයෙහි බොහෝ සඳහන් වේ. එලෙසම ඊශ්‍රායෙලයට ආසන්නයේ ම පවතින ලෙබනනය, ගාසා තීරය, ඊශ්‍රායෙලයේ අසල්වැසියෙක් වන්නා වූ ඉරාකය, ඉරානය මෙවැනි රටවල් ගැන විවිධ අනාගත වාක්‍ය බයිබලයෙහි සඳහන් වේ. ඊශ්‍රායෙලයට උතුරෙන් තිබෙන ප්‍රධාන ජාතියක් වන රුසියාව ද අපට හඳුනා ගත හැකි පරිදි ප්‍රමාණවත් සාක්ෂි බයිබලයෙහි ඇතුළත් වේ. තවද නැගෙනහිර පෙදෙසින් තිබෙන්නා වූ චීනය වැනි රටවල් පවා බයිබලීය අනාගත වාක්‍ය වලින් හඳුනා ගැනීමට හැකියාව ඇත.

ලිබියාව, ඉතියෝපියාව වැනි රටවල් අවසාන කාලය ලෙස අප හඳුන්වන මේ වර්තමාන වකවානුවේ ඊශ්‍රායෙලයට සමඟ සම්බන්ධතාවය හෝ විරුද්ධවාදීකම් පිළිබඳ ව අනාගත වාක්‍ය බයිබලයෙහි සඳහන් වේ.

## ඇතැම් රටවල් පිළිබඳ බයිබල් අනාවැකි

- ★ ඊශ්‍රායෙල් - **උප්පත්ති 15 : 18 - 21 / සෙකරියා 12 : 1 - 9 / යෙසායා 60**
- ★ ඉරානය (පර්සියාව) - **එසකියෙල් 38 : 5**
- ★ ඊජිප්තුව (මිසරය) - **යෙසායා 19 : 21**
- ★ ලිබියාව (පුට්වරු) - **එසකියෙල් 38 : 5**
- ★ කූෂ්වරු (සූඩානය) - **එසකියෙල් 38 : 5**

★ රුසියාව (මාගොග්) - **එසකියෙල් 38 : 1 / 39 : 2**
★ චීනය - **එළිදරව් 9 : 12 - 16 / එළිදරව් 16 : 12**

වර්තමාන ලෝකයේ බලවතා ලෙස හඳුන්වන ඇමරිකා එක්සත් ජනපදය නොහොත් ඇමරිකාව පිළිබඳවත් යම් දෙයක් සඳහන් විය යුතු නොවේද? එය අප සාමාන්‍යයෙන් දරන්නා වූ මතයයි. නුමුත් මෙය ඇමරිකාව පිළිබඳව බව අනුමත කළ හැකි සෘජු අනාගත වාක්‍යයක් බයිබලයේ සඳහන් නොවේ. ඊශ්‍රායෙල් ජාතියේ පියා වූ ආබ්‍රහම් හට අහස පොළොව මැවූ දෙවියන්වහන්සේ ප්‍රකාශ වී දුන් පොරොන්දුව ගැන **උප්පත්ති 12 පරිච්ඡේදයේහි** සඳහන් වේ. මේ අනුව ඊශ්‍රායෙල්ට ඉතා හොඳ මිත්‍රත්වයක් දක්වන්නා වූ ඇමරිකාව ඉතා සශ්‍රීක රටක් ලෙස අද ලොව තුල බැබළෙයි. ඉතින් මේ දෙවියන්වහන්සේ මීට අවුරුදු 3000 කටත් එහා කාලයකදී ආබ්‍රහම්ට දුන් පොරොන්දුව ඉටුවෙමින් පවතින බව කිව හැකිය. පසුව අනාගතවක්තෘ **සෙකරියා 14:2** හි **"එසේය. මම යෙරුසලමට විරුද්ධව සියලූ ජාතීන් යුද්ධයට රැස් කරන්නෙමි."** මෙහි සියලු ජාතිය නම් ඇමරිකාවද ඇතුළත්වයි. සියලු ජාතීන් ඊශ්‍රායලයට එරෙහි වන දවසක් ගැන එතනින් අපට පැහැදිලි වේ.
අප ජීවත් වන කාලවකවානුවේ ඇමරිකා එක්සත් ජනපදය ලෝක බලවතාව සිටීම ගැන එහි සෘජුවම පවසා නැති නිසා ඒ පිළිබඳව ශුද්ධ බයිබලයෙහි ඇති දේ කෙටියෙන් විමසා බලමු.

අවසාන කාලයට සම්බන්ධව ඇමරිකාව පිළිබඳව ශුද්ධ බයිබලයේ සඳහන් නොවන්නේ ඇයි? මේ පිළිබඳ යෝජනා කීපයකි.

01. ඇමරිකාව පමණක් තවත් බොහෝ



ප්‍රබල රටවල් ගැන නිශ්චිත අනාගත වාක්‍ය බයිබලයේ සඳහන් නොවේ. එම නිසා ඇමරිකාවද ඇතුළත්ව දෙවියන්වහන්සේ එම රටවල් පිළිබඳ යමක් ලිවීමට නොපෙලඹූ වූ බව හෝ එය අවශ්‍යයයි නොසිතූ බව අපට අනුමාන කළ හැක. එය එක් යෝජනාවකි. ඇමරිකාව යනු ඓතිහාසික, පෞරාණික රටක් නොවන බවත් එය අප රට මෙන් අවුරුදු 2500 ක ඉතිහාසයක් සහිත රටක් නොවන බවත් ඊට බොහෝ අඩු වසර සිය ගණනක ඉතිහාසයක් ඇති රටකි. එම නිසා ඇමරිකාව දෙවියන්වහන්සේගේ අනාගත වාක්‍ය දෘෂ්ඨි කෝණයට හසු වී නැත. නුමුත් මෙම වකවානුවේ ඉතා වැදගත් කොටසක් ඔවුන් විසින් ඉටු කරන බව නම් සැකයක් නැත.

02. ඇමරිකාවේ ආර්ථික බලය බිඳවැටිය හැකිය. වර්තමානයේ ලෝකයේ තිබෙන සියලු රටවලට පාහේ ඇමරිකාව විසින් බදු පනවා ඇත. අප යම් භාණ්ඩයක් ඇමරිකාවට අපනයනය කළහොත් ඇමරිකානු වෙළඳපලේදී එයට බදු පැනවේ.

එය මුළු ලෝකයටම මහත් කරදරයකි. මේ හේතුවෙන් අනාගතයේදී සියලු රටවල් ඇමරිකානු භාණ්ඩ වර්ජනය කළොත් ඇමරිකානු ඩොලරය ජාත්‍යන්තර මුදල් ඒකකය නොවී බිඳ වැටුණු රාජ්‍යයක් බවට පත් විය හැක. මෙය ඇමරිකාව ගැන සඳහන් නොවිය හැකි එක් යෝජනාවකි.

03. ඉතා භයානක ඉරණමකින් එනම් ඇමරිකාවට න්‍යාෂ්ඨික බලය සහිත සතුරන් බොහෝමයක් ඇත. භයංකර භේදවාචකයක් ඇමරිකාවට අත් වීමට ඉඩ ඇත. නොසිතූ මොහොතක ඇමරිකාවට න්‍යාෂ්ඨික ප්‍රහාරයක් එල්ල වී ඇමරිකාව බොහෝ සෙයින් විනාශ වී යා හැක. එමඟින් ඇමරිකාව යළි බල රහිත රටක් බවට පත් විය හැකිය. එසේ වූවහොත් ලෝකයේ සිදු විය හැකි භයංකරම දුක්ඛිතම සිද්ධිය එය බවට පත් වේ.

04. හදිසියේම ඇමරිකානු එක්සත් ජනපදය මහා පිබිදීමකට ලක් ව දෙවියන්වහන්සේ වෙතට හැරීම එය කෙතරම් අනර්ඝ ද? එලෙසම එසේ මහා දීපව්‍යාප්ත පිබිදීමක් ඇති වූ වහාම යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීම සිදු වුවහොත් (එම පැමිණීම නම් යේසුස්වහන්සේගේ වලාකුළු මතට පැමිණීමයි.) මෙය **1 තෙසලෝනික 4 :13** සිට තිබෙන කොටසෙහි ලියා තිබේ.

එනම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වර්ග යේ සිට පැමිණ උන්වහන්සේ කෙරෙහි අදහාගෙන සිටින අයව ඔසවා ගැනීමයි. ඇමරිකාවේ එලෙස මහත් පිබිදීමක් සිදු වී යේසුස්වහන්සේව අදහා ගැනීමකට අවංකව පෙලඹුනොත් උන්වහන්සේ පැමිණි විට එම රටේ බොහෝ දෙනෙක් ස්වර්ගයට ඔසවා ගනු ලබයි. මිලියන ගණනාවක් ස්වර්ගයට ඔසවා ගනු ලැබුවහොත් එහි ජනගහනය ඉතා කුඩා වේ. එවිට එම රට ලෝකයට බලපෑමක් කළ හැකි මට්ටමක නොසිටී.

මෙවැනි හේතු කරණකොටගෙන අවසාන කාලසීමාවේදී ඇමරිකා එක්සත් ජනපදය ලෝකයට වැඩි බලපෑමක් නොකරන රාජ්‍යයක් බවට පත් විය හැකිය.

- නෙවිල් ජයසුන්දර සහෝදරයාගේ දේශනාවක් ඇසුරින් සකස් කලේ -

**- අමන්දි -**

# කුරුසියේ ප්‍රේමය

දිදුලන විදුලි පහන් සහ අලංකාරවත් සැරසිලි ද වසරේ පෙර නොවූ විරූ ලෙස භාණ්ඩ හා සේවා සඳහා වට්ටම් ද හිමිවන මේ උඳුවප් මාසයේදී ලෝකයේ බොහෝ දෙනා සැලසුම් කරන්නේ මේ මහා සේල් සහ වට්ටම් වල ලාභය අයිති කර ගැනීමට නොවේද? සමහර විට ඔබත් යම් මුදලක් ඉතිරි කරගෙන බලා සිටින්නේ මේ නත්තලට මහා වට්ටම් සහිත මෙගා සේල් එකක් ආරම්භ කරන දිනයක් එනතුරු විය හැකිය.

නමුත් සාමය, ප්‍රීතිය සහ නව ආරම්භයන් පිළිබඳ හැඟීම් අවදි කරන මේ යේසුස්වහන්සේගේ උපත සැබවින්ම දිව්‍යමය බලාපොරොත්තුවේ මොහොතක් වන අතර, එහි පූර්ණ, ගැඹුරු වැදගත්කම අවබෝධ කරගත හැක්කේ එහි අවසාන අරමුණ වන කුරුසිය තුළින් පමණි. නත්තල් කතාව යනු ගවලෙනක සිටි බිළිඳකු ගැන පමණක් නොවේ. එය මුදවාගැනීමේ සැලසුමක් වූ ගමනක ආරම්භයයි, මනුෂ්‍ය වර්ගයාගේ ගැලවීම සඳහා තම ජීවිතය දීමටම උපත ලද ගැලවුම්කරුවෙකුගේ ප්‍රේම ක්‍රියාවකි.

ගැලවීමේ මෙම කේන්ද්‍රීය පණිවිඩය අපගේ ඇදහිල්ලේ මුල්ගල වන අතර, එය පරණ ගිවිසුම් අනාවැකිවල සිට නව ගිවිසුමේ ඉටුවීම දක්වා ශුද්ධ ලියවිල්ලේ සමස්ත ව්‍යුහය තුළ ගැඹුරින් පෙන්වා දී ඇත.

## අනාවැකි පළ කළ සැලැස්ම

ගැලවීම සඳහා වූ සදාකාලික සැලැස්ම බෙත්ලෙහෙමේදී ආරම්භ වූයේ නැත. එය දෙවියන්වහන්සේගේ අභිමතය පරිදි ස්ථාපිත වූ අතර, දේවදූතයා මරියාට දර්ශනය වීමට සියවස් ගණනාවකට පෙර, උන්වහන්සේගේ අනාගතවක්තෘවරුන් විසින් අනාවැකි පළ කරන ලදී. අනාගතවක්තෘන් රජෙකු ගැන පමණක් නොව, දුක් විඳින සේවකයෙකු ගැනද කතා කළහ.

ක්‍රිස්තුස්වහන්සේගේ උපතට වසර 700කට පමණ පෙර යෙසායා විසින් ලියන ලදː **"නුමුත් උන්වහන්සේ තුවාල ලැබුවේ අපේ අපරාධ නිසාය, පොඩිකරනු ලැබුවේ අපේ අයුතුකම් නිසාය. අපට සමාදානය ගෙනදෙන දඬුවම උන්වහන්සේ පිටට පැමුණුණේයː උන්වහන්සේගේ පහරවලින් අපට සුවය ලැබී තිබේ" (යෙසායා 53:5).** මෙම අනාවැකිය මගින්, මෙසියස්වහන්සේගේ පූජාව ලෞකික ජයග්‍රහණයෙන් නොව, දෙවියන්වහන්සේගේ සැලසුම තුළ, ක්‍රිස්තුස්වහන්සේගේ දුක් විඳීමෙන් සනිටුහන් වනු ඇතැයි යන්නත්, එම ක්‍රියාව උන්වහන්සේගේ නිහතමානී උපතින් ආරම්භ වූ බවත් පෙන්වා

දුන්නේය.


නියමිත මොහොත පැමිණි විට, දිව්‍යමය අරමුණු පැහැදිලිව ප්‍රකාශ විය. සිහිනයකින් යෝසෙප්ට දර්ශනය වූ දේවදූතයා; **"ඇය පුත්‍රයෙකු බිහි කරන්නීය, ඔබ උන්වහන්සේට යේසුස් යන නම තබන්න, මන්ද උන්වහන්සේ තම සෙනඟව ඔවුන්ගේ පාපවලින් ගළවන බැවිනි" (මතෙව් 1:21).** "යේසුස්" යන නමේම (හෙබ්‍රෙව් භාෂාවෙන් යෙෂුවා) තේරුම "දෙවියන්වහන්සේ ගළවයි" යන්නයි. උන්වහන්සේගේ අනන්‍යතාවය සහ මෙහෙවර එකිනෙකට සම්බන්ධ වේ.

පාවුල්තුමා පිලිප්පිවරුන්ට ලියූ ලිපියෙහි මෙම ගැඹුරු නිහතමානීකම තවදුරටත් පැහැදිලි කරන්නේ, යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් සිටියත්, උන්වහන්සේ තම දිව්‍යමය වරප්‍රසාද අත්හැරීමට කැමති වූ බවත්, සේවකයෙකුගේ ස්වරූපය ගත් බවත්ය. මෙම නිහතමානී ක්‍රියාව ජීවිත පූජාවෙන් අවසන් විය.

**"මනුෂ්‍යාකාරයෙන් සිටිය කලත්, මරණය, එසේය, කුරුසියේ මරණය දක්වා කීකරුවූ සේක" (පිලිප්පි 2:8).**

යේසුස්වහන්සේගේ මුලු ජීවිතයම කුරුසිය දෙසට වූ ගමනක් විය. ගවලෙනක සිටි අලුත උපන් බිළිදෙකුගේ සිට, ගොල්ගොතාවට ඇවිද යාමේ කීකරුකම දක්වා, සෑම මොහොතක්ම උන්වහන්සේගේ පියාණන්ගේ මුදවාගැනීමේ කැමැත්තට යටත්ව ජීවත් විය. උන්වහන්සේ තම අරමුණ දැන සිටි සේක, තම ගෝලයන්ට මෙසේ ඉගැන්වීය.

**"මක්නිසාද සැබවින් මනුෂ්‍ය පුත්‍රයා සේවය ලබන්ට නොව සේවයකරන්ටද බොහෝ දෙනෙකු උදෙසා මිදීමේ මිලයක් කොට තමාගේ ජීවිතය දෙන්ටද ආයේයයි කී සේක" (මාර්ක් 10:45).** උන්වහන්සේගේ ඉගැන්වීම, ආශ්චර්යයන් සහ කොන් කරන ලද අය සමඟ වූ දයානුකම්පිත අන්තර් ක්‍රියා සියල්ලම, ශුද්ධ වූ දෙවියන්වහන්සේ සහ පව්කාර මනුෂ්‍යත්වය අතර පරතරය පියවීමට හැකි උපරිම ප්‍රමාණයට යාමට කැමති වූ ප්‍රේමයේ ගැඹුර පෙන්වා දුන්නේය. උන්වහන්සේ පැමිණියේ අපට ජීවත් විය යුතු ආකාරය ඉගැන්වීමට පමණක් නොව, අප වෙනුවට මිය යාමෙන් දිව්‍යමය ප්‍රේමයේ බලය නිරූපණය කිරීමටයි.



ඉතිරි කොටස සඳහා 17 වන පිටුව බලන්න

# දෙවියන්වහන්සේගේ මිෂනාරී හදවත (යෝනා 4:9-11)



බයිබලයෙහි තිබෙන කුඩා පොතක් වන යෝනා පොත ඔබ කියවා ඇතැයි විශ්වාස කරමි. නැතහොත් අදම එම පොත කියවන්න. එම පොතෙහි සඳහන් වන යෝනා සමඟ දෙවියන්වහන්සේ ක්‍රියා කරන ආකාරය හා සම්බන්ධතාවය හා යෝනා තම සේවයේ යොදා ගන්නා ආකාරය මෙහි මනාව විස්තර කරයි. යෝනා මියයන්නට ආශාවකින් සිටි අවස්ථාවකදී **4:4** පදයෙහි දෙවියන්වහන්සේ නැවත යෝනා ව ප්‍රශ්න කරන සේක. **4:9** පදයේ "**ලබුවැල ගැන කෝපවන්නට නුඹට යුතුදැ**"**යි** දෙවියන්වහන්සේට කී සේක. " මැරෙන තරම් කෝප වෙන්ට මට යුතු"යැයි ඔහු කීවේය. යෝනා දෙවියන්වහන්සේට ඔහුගේ කෝපය ප්‍රකාශ කරයි. එහෙත් දෙවියන්වහන්සේගේ පිළිතුර. දෙවියන්වහන්සේට ආවේණික වූ නියම ගතිගුණ ගෙනහැර පෑවේය. යෝනාගේ අදහස ගැන දෙවියන්වහන්සේ තරවටු නොකරන සේක. එබැවින් තරවටු කිරීම වෙනුවට මෘදු නමුත් ස්ථිර ස්වභාවයකින් යෝනාට හේතු කාරණා පෙන්වා දීම දෙවියන්වහන්සේ ඇරඹූ සේක.

බයිබලයෙහි අධෛර්යය වූ සේවකයින්ට දෙවියන්වහන්සේ කතා කිරීමේදී මෙම මෘදු, ස්ථිර ස්වභාවය නිතර දැකිය හැකිය. මෝසෙස්, යෙරමියා සහ එළියා දෙවියන්වහන්සේට විරුද්ධව චෝදනා කළවිට ඔවුන් සමඟ දෙවියන්වහන්සේ ක්‍රියා කළ අවස්ථා වල මෙය අපට විද්‍යාමාන වේ. (**ගණන් කථාව 11, යෙරමියා 15:1, රාජාවලිය 19**) දෙවියන්වහන්සේ අප හික්මවන නමුත් , එය ඉතා නුවණැතිව ඉටු කරන සේක. අපට ඉවසිය හැකි ප්‍රමාණය සහ අපට වඩාත්ම හොඳ දේ දෙවියන්වහන්සේ දැන සිටි සේක. අප සමඟ දෙවියන්වහන්සෙගේ ප්‍රමිතිය එතුමා කිසිවිටකත් පහළ නොදමන සේක. දෙවියන්වහන්සේ තම කොන්දේසි වෙනස් නොකරන නමුත් තමාගේ හඬ මෘදු කරන සේක.

## දෙවියන්වහන්සේ කරුණු පහදා දේ (4:10,11)

**4:10** මෙසේ සඳහන් වේ. "**එවිට ස්වාමීන්වහන්සේ නුඹේ මහන්සි වීමක්වත්, වැවීමක්වත් නැතිව රාත්‍රියකින් හටගෙන රාත්‍රියකින් නැතිව ගිය ලබුවැල කෙරෙහි නුඹ අනුකම්පා කෙළෙහිය.**" මෙම විනාශ වූ ලබුවැල සමඟ උන්වහන්සේගේ ගැඹුරු සම්බන්ධතාවයක් නැති බව යෝනාට විශේෂයෙන් පෙන්වා දීමට දෙවියන්වහන්සේට අවශ්‍ය වුණි. මේ ලබුවැල සඳහා යෝනා කිසිවක් නොකළේය. "ඔහුට එහි කිසිම ආයෝජනයක් නැතැ"යි කොලෙන්බර්ගර් නැමැත්තා විස්තර කරන්නේය. එය හදිසියේම හටගත් අතර හදිසියේම විනාශ මුඛයට ගියේය. එහෙත් මෙම ලබුවැල සම්බන්ධයෙන් මහත් සැලකිල්ලක් යෝනා තුළ වූ බව පෙනේ.

ලබුවැල සමඟ යෝනාගේ සම්බන්ධතාවයට වඩා බොහෝසෙයින් වැදගත් වූ සම්බන්ධතාවයක් තමා සහ නිනිවය අතර පවතින බව දෙවියන්වහන්සේ තවදුරටත් කතා කොට කී සේක. **4:11** පදය " **එසේ නම්, තමුන්ගේ දකුණවත්, වමවත් නොදන්නා එක් ලක්ෂ විසිදාහකට වඩා මනුෂ්‍යයෝද, බොහෝ මෘගයන්ද සිටින්නා වූ නිනිවය නම් වූ ඒ මහත් නුවර කෙරෙහි මාත් අනුකම්පා කළයුතු නොවේ දැ**"යි කී සේක. නිනිව වාසීන් හිඟකමින් සිටින්නවුන් සේ දෙවියන්වහන්සේ පෙන්වා දෙන සේක. ඔවුන් තමුන්ගේ දකුණවත්, වමවත් නොදැන සිටි පිරිසකි. එනම් ඔවුන් සත්‍ය නොදැන සිටින බවයි. කොයිබට ගමන් කළයුතු දැයි ඔවුහු නොදැන සිටියහ. ඔවුන් අහිංසකයින් නොවුනද අඥානයින් වූහ. දෙවියන්වහන්සේ මොවුන් පිළිබඳ සැලකිලිමත් වන්නේ ඔවුන්ගේ සහජ චරිතාකමක් නිසා නොව ඔවුන්ගේ හිඟ කම හේතුවෙනි.

මොවුන් හිඟකමින් සිටින පිරිසක් බැවින් සැලකිලිමත් ලෙස දෙවියන්වහන්සේ ප්‍රතිචාර දෙමින් "ඒ මහත් නුවර කෙරෙහි මාත් අනුකම්පා කළ යුතු නොවේදැයි" ඇසූ සේක. මෙහි විශේෂ කොට දක්වන්නේ නිනිව වාසීන්ගේ අසරණකමයි. මෙය ශුභාරංචියේ හරය වෙත අප ගෙන එන්නේය. පාපයේ බලය යටතේ අපි අසරණව සිටින්නෙමු. අප ගලවා ගැනීමට ශක්තියක් නොමැතිව කිසි බලාපොරොත්තුවක් නොමැතිව අපි සිටිනනෙමු. එහෙත් දෙවියන්වහනසේ අනුකම්පාවෙන් අප දෙස නෙත් හෙලා අපගේ ගැලවීම උදෙසා මාර්ගයක් සැපයූ සේක. ඔබ ගැලවීම ලබා තිබේද? එසේ නම් උන්වහන්සේ අනුකම්පා සහගත දෙවියන්වහන්සේ බව ඔබ දනී. දෙවියන්වහන්සේ අනුකම්පා සහගත නම් සැමටම බලාපොරොත්තුවක් තිබේ. සැමටම බලාපොරොත්තුවක් තිබේ නම්, ශුභාරංචිය නොදන්නවුන්ට එය ප්‍රකාශ කිරීමේ කටයුතු වල ඔබ සම්බන්ධ විය යුතුය. දෙවියන්වහන්සේ ධර්මදූත අභිලාශයකින් ක්‍රියාකරන සේක. එබැවින් එතුමන්ගේ දරුවන්ද ධර්මදූත අභිලාෂයකින් ක්‍රියා කළ යුතුව ඇත.

ධර්මදූතනය නොහොත් සුභාරංචිකරණය සඳහා දී ඇති උසස්තම තර්කය මෙය වේ. රොබට් ඊ ස්පියර් මෙවැනි අදහසක් දක්වා ඇත. "**ධර්මදූතනයේ අති ශ්‍රේෂ්ඨ තර්කයන් විශේෂ වචන තුළ හමු නොවේ. ධර්මදූත ව්‍යාපාරයේහි ගැඹුරුතම පත්ල දෙවියන්වහන්සේ තුළ හෙවත් උන්වහන්සේගේ ස්වභාවය තුළ අපට හමු වේ**".

මුළා වූ අය දෙවියන්වහන්සේගේ සැලකිල්ලට භාජනය වේ. මිනිසුන් හිඟ කමේ සිටින අතර අපි දෙවියන්වන්සේගේ සැලකිල්ල ඉදිරියට ගෙන යා යුතුම වෙමු. මිෂනාරිවරයකු වන හෙන්රි මාටින් මෙය ඉතා අලංකාර ලෙස වචනයට දමා ඇත. "**ක්‍රිස්තුස්වහන්සේගේ ආත්මය යනු ධර්මදූත ආත්මයකි. උන්වහන්සේ වෙත අපගේ ළංවීම වැඩිවීමත් සමඟම වැඩි පරිශ්‍රමයකින් යුත් ධර්මදූත සේවකයින් බවට අප පත්විය යුතු වේ.**"

දෙවියන්වහන්සේගේ ඉගැන්වීම කෙරෙහි යෝනාගේ ප්‍රතිචාරය පිළිබඳව සඳහන් කිරීමකින් තොරව යෝනා පොත අවසන් වන්නේය. මුළා වූවන් කෙරෙහි දෙවියන්වහන්සේගේ සැලකිල්ල සම්බන්ධයෙන් නියෝජිතයෙකු වන්නට ඔබ කැමතිද? ඒ වෙනුවෙන් ඔබගේ ජීවිතය දෙනවාද? එසේ නම් දෙවියන්වහන්සේ තුළ ඇති මෙම සැලකිල්ලට ඔබත් කොටස්කරුවකු වනු ඇත. දෙවියන්වහන්සේ තුළ ඇති සැලකිලිමත් හැඟීම් සමඟ ඔබ කොටස්කරුවකු වන විට ඔබගේ හදවත ද දෙවියන්වහන්සේගේ හෘද ස්පන්දනයත් සමඟම ස්පන්දනය වනු ඇත.

**- ජීවන හඬ -**

# ක්‍රිස්තු උපත

සෑම දේට වාණිජමය වටිනාකමක් දෙන වර්ථමාන ලෝකයේ ක්‍රිස්තු උපත හෙවත් නත්තල කිතුණු ලෝකය සමරන ආකාරය පිළිබඳව ඔබ සෑහීමට පත්වනවාද? **"මුළු සෙනගට මහත් ප්‍රීති උපදවන"** උපතක් ලෙස ශුද්ධ බයිබලයේ හඳුන්වා දී ඇති (**ලූක් 2:10**) ඒ ඓතිහාසික උපත සැබවින්ම ප්‍රීති විය යුතු කාරණයකි. මෙලොව ඉපදෙන ඕනෑම බිළිඳෙක් ගැන අප ප්‍රීති වනවාට වඩා යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උපත ගැන අපි ප්‍රීති විය යුතු වෙමු. මන්ද එම උපත මෙලොව වසන මුළු මිනිස් සංහතියටම යහපතක් හා ආශිර්වාදයක් ගෙන දීමට සමත් වූ උපතක් බැවිනි. යේසුස්වහන්සේ මෙලොවට බිහි වූ ගැළවුම්කරුවාණන් බව **ලූක් 2:11** හි සඳහන් වේ. එහෙත් මෙම උතුම් උපත සැමරීමත් වාණිජකරණය වී තිබීම ඉතා කණගාටුදායකය. උන්වහන්සේ උපත ලැබූ ගවමඩුව පටන් උන්වහන්සේගේ ඉපදීමට අදාළ සෑම දේම වර්ථමානයේ වෙළඳ භාණ්ඩයක් බවට පත්ව ඇත. ක්‍රිස්තු උපත තුළින් මනුෂ්‍යයා අද සොයන්නේ ලෞකික ප්‍රීතියක් සහ තෘප්තියකි.



යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උපත අනිත් මිනිස් උපත් වලට වඩා අසහාය හා අද්විතීය වන්නේ ඇයි දැයි අපි සලකා බලමු. ශුද්ධ බයිබලයේ මෙම උපත ගැන කරුණු රැසක් සඳහන්ව ඇත. යේසුස්වහන්සේගේ උපත ගැන අනාවැකි ශුද්ධ බයිබලයේ පරණ ගිවිසුමේ සඳහන් වන අතර එම අනාවැකි සනාථ කරමින් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මෙලොවට බිහිවූ බව අලුත් ගිවිසුම පෙන්වා දෙයි. උන්වහන්සේ මෙලොවට පැමිණීම මනුෂ්‍යයාගේ සදාකාලික යහපත උදෙසා වැදගත් බව බොහෝ ශුද්ධ ලියවිලි වලින් පෙන්වා දිය හැක. මේ ඉන් එක් පදයකි. **"පව්කාරයන් ගළවන්නට ක්‍රිස්තුස් යේසුස්වහන්සේ ලෝකයට ආ සේක..."** (**1 තිමෝති 1:15**).

ක්‍රිස්තුස්වහන්සේගේ උපත හා එය සැමරීම පිළිබඳව අප විසින් හරි අවබෝධයක් ලබා ගත යුතුයි. ඒ උදෙසා අපි ශුද්ධ ලියවිලි කොටසක් කියවමු. (**පිලිප්පි 2:5-7**) **ක්‍රිස්තුස්වහන්සේ තුළ තිබුණු සිතම නුඹලා තුළත් තිබේවා. උන්වහන්සේ දෙවියන්වහන්සේගේ රූපාකාරය දරණ සේක්, දෙවියන්වහන්සේට සමානව සිටීම තමන් විසින් අල්ලාගෙන සිටිය යුතු වූ වස්තුවකැයි නොසිතා, එය ඉවත් කර, දාසයෙකුගේ ස්වරූපය ගෙන, මනුෂ්‍යයන්ගේ සමානත්වයට පැමිණිසේක. මනුෂ්‍යාකාරයෙන් සිටිමින් උන්වහන්සේ, මරණය, එනම් කුරුසියේ මරණය දක්වා, පහත් වී කීකරු වූ සේක. එබැවින් දෙවියන්වහන්සේ උන්වහන්සේව ඉතා උසස් කොට, සියලු නාම වලට වඩා උසස් නාමය දුන් සේක. එසේ**

**කළේ ස්වර්ගයෙහිද, පොළොවෙහිද, පොළොවෙන් යටද සියල්ලන් යේසුස් යන නාමයෙන් දණ නමන පිණිසත්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වාමින්වහන්සේ බව පියවූ දෙවියන්වහන්සේගේ ගෞරවය සඳහා සියලු දිව්වලින් ඒත්තු ගන්න පිණිසත්ය.**

මෙම කොටස ඔබ සැලකිලිමත්ව කියෙවුවේ නම්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මෙලොවට පැමිණීම හෙවත් උපත, මරණය හා මළවුන්ගෙන් නැවත නැගිටීම ගැන සඳහනක් ඇති බව අවබෝධ කරගත හැක. 5 වන පදයේ ක්‍රිස්තුස්වහන්සේව හඳුන්වා දී ඇති අතර, උන්වහන්සේ මෙලොවට පැමිණෙන්ට පෙර සිටි තත්වය හා ස්වභාවය 6 වන පදයේ පෙන්වා දෙයි. උන්වහන්සේ දෙවියන්වහන්සේට සමාන බව මෙම පදයෙන් අපට තේරුම්ගත හැක. සදාකාල අතීතයේ පටන්, සදාකාල අනාගතය දක්වා උන්වහන්සේ ඒකාකාර දිව්‍ය තැනැන්වහන්සේය. මෙම දිව්‍ය ස්වභාවය වෙනස් වන්නේ නැත. **කොලොස්සි 2:3** වන පදයේද, උන්වහන්සේගේ එම දිව්‍යමය ලක්‍ෂණ දකින්නට හැකිය. **"ඒ තැනැන්වහන්සේ තුළ ප්‍රඥාවේත්, දැනගැන්මේත්,'සියලු වස්තු' නිධාන කර ඇත්තේමය".** මේ ආකාරයෙන් දේවත්වයෙන් පරිපූර්ණව සිටි උන්වහන්සේ පොළොවට පැමිණෙන විට කළ අති විශිෂ්ඨ **ක්‍රියාව 2:7** වන පදය පැහැදිලි කරයි. **"එය ඉවත් කර, දාසයෙකුගේ ස්වරූපය ගෙන මනුෂ්‍යයන්ගේ සමානත්වයට පැමිණි සේක"** 'එය ඉවත් කර' යනුවෙන් පැවසෙන්නේ, උන්වහන්සේගේ එම දිව්‍ය ස්වභාවය ඉවත් කිරීම නොව දෙවියන්වහන්සේගේ මහිමවත් බාහිර පෙනීම ඉවත් කර සාමාන්‍ය මනුෂ්‍යය ස්වරූපයට පැමිණුන බවයි. එහෙයින් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උත්පත්තිය මෙම 7 වන පදය තුළින් අපි දකින්නෙමු. එතරම් මහත් තත්වයෙන් හා පරාක්‍රමයෙන් යුතු වූ උන්වහන්සේ මෙලොවට පැමිණීමට හේතුව **පිලිප්පි 2:8** හි සඳහන්ය. එනම් කුරුසිය මත මරණය විඳීමටයි. මේ මරණය ඔබටත් මටත් පව් කමාව ලබා දීම පිණිස දෙවියන්වහන්සේට අතිශයින් වැදගත් වූ නිසා උන්වහන්සේගේ මෙලොවට පැමිණීමද වැදගත් විය. **"මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළ සේක" (යොහාන් 3:16).** මෙම පදය තුළ අප කෙරෙහි ඇති දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ විශාලත්වය ඔබ දකිනවාද? උන්වහන්සේ ඔබට මට ප්‍රේම කරන නිසා, අති ශුද්ධ තම පුත්‍රයාණන්ට අපගේ පාප වලට හිමි දඬුවම විඳින්න සැලැස්සූ සේක. එමනිසා යේසුස්වහන්සේ මෙලොවට ඉපදුණු ප්‍රධාන හේතුව අප වෙනුවෙන් මරණයට පත් වීමට බව පිළිගත යුතුය.

ඔබ ඉහත සඳහන් දේ විශ්වාස කරනවාද? ඔබ විශ්වාස කළොත් **යොහාන් 3:16** පදයේ දෙවැනි කොටසෙහි සඳහන් පරිදි **"උන්වහන්සේ කෙරෙහි අදහාගන්නා සෑම දෙනාම විනාශ නොවී සදාකාල ජීවනය"** ලබාගන්නා බව ඒකාන්තයි. ඔබ දෙවියන්වහන්සේ ඉදිරිපිට පවුකරුවෙකු බව පිළිගෙන, ඔබගේ පාප ගැන පසුතැවිලි වී ඔබගේ පාප වෙනුවෙන් මරණයට පත් වූ උන්වහන්සේගෙන් පව් කමාව ලබා ගන්න. අවංකවම එසේ කළොත් මෙම 'ක්‍රිස්තු උපතේ' සැබෑ ප්‍රීතිය ඔබට අතිවිඳිය හැක. ආමේන්!


**- ඈන් ජයසුන්දර -**

# පේතෘස්ගේ පීඩා ඉවසීමේ ශක්තිය

**"මාගේ මිත්‍රයෙනි ශරීරය නසා ඉන්පසු කිසිවක් කරන්නට බැරි අයට භයනොවෙල්ලා.... නුමුත් නුඹලාට කියමි. නුඹලා භයවිය යුතු කාටදැයි නුඹලාට පෙන්වමි. නැසුවායින් පසු නිරයෙහි හෙළන්ට බලය ඇත්තාවූ තැනැන්වහන්සේටම භය වෙයල්ලා. එසේය උන්වහන්සේටම භය වෙයල්ලා යයි නුඹලාට කියමි. නුඹලාගේ සියලු හිසකේ පවා ගණන්කර තිබේ. භය නොවෙල්ලා" (ලූක් 12:4,5,7 පද).**

**"දෙවියන්වහන්සේ නිසා ධර්මිෂ්ඨකමට පීඩා විඳින්නෝ ආශිර්වාද ලද්දෝය. මක්නිසාද, ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේය" (මතෙව් 5:10).** ඉහත දැක්වෙන පද තුළින් අපේ ස්වාමීවූ යේසුස්වහන්සේ ඉගැන්වූ සැබෑ දේව දරුවාගේ සාක්ෂිය පේතෘස් තුළින් ඕනෑවටත් වඩා කැපී පෙනෙයි. දෙවියන්වහන්සේ නිසා පීඩා විඳීමට භය දුරුවන සිතක් අවශ්‍යය. අපි ඔහුගේ එඩිතරකම ගැන කතා කළෙමු. **ක්‍රියා 4:3** කියවන අපි පූජකයන් හා දේවමාළිගාවේ සේනාපතියාද සද්දුසිවරුද යොහාන් හා පේතෘස් පිට අත්හෙළා ඔවුන් හිරගෙයි දැමූ අයුරු දකිමු. පේතෘස් හා යොහාන් අතින් සිදුවූ වැරදි 3ක් සතුරෝ ඉදිරිපත් කළහ.

1. මව්කුස පටන් කොරව 40 වසරක් පුරා රෝගීව සිටි මනුෂ්‍යයා යේසුස්වහන්සේ නමින් සුව කිරීම.
2. සෙනඟට උන්වහන්සේව ප්‍රකාශ කිරීම.
3. යේසුතුමන් කරණකොටගෙන මළවුන් ගෙන් නැගිටීම ප්‍රකාශ කිරීම මෙම චෝදනාවන්ය.



මෙම කරුණු තුනම යහපත්වූත්, නිවැරදිවූත්, ධර්මිෂ්ඨවූත් ක්‍රියාවන් බව පේතෘස්ට මෙන්ම අපටත් පෙනේ. එහෙත් ඔවුන්, ඔහු සිරගෙයි දැමීම ගැන පේතෘස් විරුද්ධ වූයේ නැත. පීඩාව කෙරෙන් පලාගිය පේතෘස්ට දැන් දේවකරුණාවෙන් පීඩා ඉසිලීමේ ශක්තියත් තිබේ.

බොහෝවිට මට මුණගැසී ඇති ඇදහිලිවන්තයින් පීඩා ඉසිලීමට තබා, පීඩා වලට මුහුණදීමට තරම් හෝ දෙවියන්වහන්සේට විශ්වාසවූවන් නොවේ. ඔවුන් බලාපොරොත්තුවන්නේ ඇදහිලිවන්තයාට පීඩාවලින් මිදීමටත් ඒවායින් මගහැර යාමටත් දෙවියන් වහන්සේ උදව් කළයුතු බවය. මෙලොව පීඩා වලින් ජය ලැබීමට නම් නිරන්තරයෙන්ම ඇදහිලිවන්තයා ඒවාට මුහුණ දිය යුතුමය. පීඩා මැද ලබන ජය මිස පීඩා රහිත සුබදායක ජීවිත රටාවක්

දෙවියන්වහන්සේ පොරොන්දු වී නැත.

**"ලෝකයෙන් නුඹලාට බොහෝ පීඩා තිබේ. එහෙත් ධෛර්යවත් වෙයල්ලා. මම ලෝකයෙන් ජයගතිමි" යි යොහාන් 16:33** යේසුස්වහන්සේ කීසේක. **ගීතාවලිය 23:4 දාවිත් කීවේ - "මරණ සෙවණේ මිටියාවත මැදින් යන්නෙම් නමුත් කිසි උපද්‍රවයකට භයනොවන්නෙමි, මක්නිසාද ඔබ මා සමඟය"** කියාය. කිසිදු පීඩාවකදී දේවදරුවා තනි නැත. ඔහු හෝ ඇය සමඟ ස්වාමීන්වහන්සේ පීඩා අතරින් ගමන් කරනසේක.

**ක්‍රියා 5:29** පේතෘස් ප්‍රසිද්ධ "සෙන්හිඩ්‍රින්" සභාවේදී (මෙය නායක පූජකයා ඵරිසීන්, සද්දුසීන් හා ලියන්නන්ගෙන් සමන්විත වූ ධර්මාධිකරණයකි) පීඩා මැද එඩිතරවන ආකාරය බලන්න. **"මනුෂ්‍යයන්ට වඩා අප විසින් දෙවියන්වහන්සේට කීකරු විය යුතුය"** ඔහු නිර්භීතව පවසයි. **5:33** පදයේ පේතෘස් හා යොහාන් මරන්නට කුමන්ත්‍රණය කරනු ලැබුවේය. 40 වන පදයේ ප්‍රේරිතයන්ට තලා යේසුස්වහන්සේගේ නාමයෙන් නූගන්වන ලෙස තරවටු කර පන්නා දමනු ලැබූ බව දැක්වේ. එහෙත් විශ්වාසවන්ත ප්‍රේරිතවරු පීඩා ඉවසීමේ ශක්තිය තහවුරු කරගනිමින් දේවමාළිග ාවේදීත්, ගෙවල්වලදීත් යේසුස්වහන්සේ ගැන උගන්වන්නට ක්‍රියා කළහ. එදා ප්‍රේරිතයන්ට පැමිණි දුක් පීඩා, ත්‍රස්තකාරී වාතාවරණය මෙදා දක්නට නැත. අදේවදෘෂ්ටි රටවල මෙබඳු යම් යම් පීඩා වලට ලක්වන දේවදරුවන් සිටින බව අසන්නට, කියවන්නට ලැබේ. එබඳු පීඩා විඳින්නන් ගැන ඔබ යාච්ඤා කරන්නෙහිද? එසේ කරන්නට ඔබ බැඳී සිටී. ඔබ මෙබඳු පීඩාවන්ට මුහුණදීමට සූදානම්ද? **ක්‍රියා 12:1** පද අප කියවමු. ඔබේ බයිබලය පෙරළන්න. මෙහි වාතාවරණය ඉතාම ත්‍රස්තජනකය. **ක්‍රියා 8, 9** පරිච්ඡේදවල සාවුල් වැනි අයවලුන්ගේද, නායක පූජකයන්ගේද, පීඩාවලට ලක්වූ ක්‍රිස්තුස්වහන්සේගේ අලුත් ගිවිසුම් සභාව එඩිතරව පෙරමුණට ගෙන ඒමට පේතෘස් දුන් විරෝදාර නායකත්වය අතරෙහිම යාකොබ් නම් ප්‍රේරිතයා මරාදැමීමට හෙරෝද් කඩුව යෙදූ අයුරු අපට පෙනේ. ප්‍රේරිතයන් හා ඇදහිලිවන්තයන් කොයි කාටත් දක්නට ලැබුනේ ගත කිලි පොළා යන දර්ශනයන්ය. අසන්ට ලැබුනේ සිත වෙව්ලුවා යන තොරතුරුය. එහෙත් එදා පේතෘස් ඇතුලු ප්‍රේරිතයන් "සාමකාමී පරිසරයක් එළඹෙනතුරු අපි කලකට නිහඬ වෙමු" යයි තීරණය කරනු ලැබී නම්. මෙදා ක්‍රිස්තියානි ඇදහිල්ලක් ඉතිරිවේද? මෙදා ක්‍රිස්තියානි සභාවට තවමත් ජීවත් වීමට වාසනාව හා උරුමය ලැබී ඇත්තේ එදා ප්‍රේතෘස් හා ඇදහිලිවන්තයින් ඇතුලු සභාව පීඩා මැද පිඹින ලද ජීව වායුව නිසාය. පීඩා මැද ඔවුන් හෙලූ අවසන් සුසුම් සභාවට ජීවනය පොවන ප්‍රාණ වායුව නොවීද? මෙබදු වාතාවරණයකදී හෙරෝද්, පේතෘස් අල්ලා හිර කළත් ඔහුගේ පීඩා ඉසිලීමේ ශක්තිය කිසිලෙසකින් සසලවූයේ නැත. යේසුස්වහන්සේගේ පෙරමඟ දූතයා වූ යොහාන් බෞතීස්ත කොපමණ විශ්වාසවන්ත මෙහෙයක් ඉටු කළ මනුෂ්‍යයෙක්ද? ඔහු, යේසුස්වහන්සේ පාපය දුරු කරන බැටළු පැටවාණෝ බවට සාක්ෂි දුන්නේය. එහෙත් ඒ සමයේහි ජීවත් වූ හෙරෝද් ඇන්ටිපස් විසින් යොහාන් බෞතීස්ත හිර ගෙදරට

යැවූ විට ඔහුට තමා විසින් සාක්ෂි දැරූ මෙසියස්වහන්සේ කෙරෙහි සැකයක් පහළ වූ අයුරුත්, උන්වහන්සේ මෙසියස්වහන්සේම තම තමාව හෙරෝද් ඇන්ටිපස් ගේ සිපිරි ගෙයින් නිදහස් කරගත යුතු බවත් සිතමින් පීඩාවේදී චංචල විය. (**මතෙව් 11:1-7 දක්වා**). පේතෘස්ගේ පීඩා ඉසිලීමේ ශක්තිය සිපිරිගෙයි මුරකරුවන් 16 දෙනෙකු අතරේ මරණ සෙවනේ බියකරු බවින් පවා සෙලවුණේ නැත. ඔහු නැසීයන සිරුර කෙරෙහි නොව ඉන් අනතුරුව හිමිවන සදාතන ජීවනය කෙරේ මුළු බලාපොරොත්තුව තබා සිටී. මේ දැඩි අධිෂ්ඨානය නිසාම මරණය කෙරේ ඔහු සැලකිලිමත් වන්නේද නැත. පේතෘස් මරණය අතරේ නිදාසිටියි. එහෙත් පීඩා මැද ජය පැමිණ දේව හස්තය ක්‍රියාත්මක වෙයි. **1 පේතෘස් 3:9** ඔහු ඔබටත් මටත් පීඩා ඉසිළීමේ රහස උගන්වයි.

**"නපුරට නපුරවත්, නින්දාවට නින්දාවවත් නොකොට, නුඹලාට ආශිර්වාදයක් උරුමවන පිණිස කැඳවනු ලැබූ බැවින් ආශිර්වාදම කරපල්ලා" එළිදරව් 7 වන පරිච්ඡේදයේ 13-14** පද අපි කියවමු. "**එවිට වැඩිමහල්ලන්ගෙන් එක්කෙනෙක් මට කථාකොට, සුදුසළු පැළඳ සිටින මොවුහු කව්රුද? කොතැනින් ආවෝදැයි"** මාගෙන් ඇසුවේය. මමද, මාගේ ස්වාමිනි ඔබ දන්නෙහි යයි කීමි. ඔහු කියනුයේ, **"මොව්හු මහත් පීඩා මැදින් එන්නෝය. ඔව්හු තමුන්ගේ සළු බැටළුපැටවාණන්ගේ ලෙයින් සෝදා සුදුකර ගත්තෝය"**. ස්වර්ග රාජ්‍යයේදී සුදුසළු පළඳින්නට නම් ඔබටත් මටත් පීඩා මැදින් යන්නට ශක්තිය අත්‍යාවශ්‍යය. එය ඔබත් මමත් යාච්ඤාවෙන් ඉල්ලා සිටින ප්‍රමාණයට යේසුස්වහන්සේ සපයන සේක.




බයිබලීය අටුවාවන්හි පේතෘස්ගේ අන්තිමය කුරුසියක හිස පහතට දමා ඔහු ඇණ ගසා මරණයට පත් කළ බව දැක්වේ. පීඩා මැද පේතෘස් ජය ලබන විට මේ අපට ප්‍රථමයෙන් හමුවූ බියසුලු ගෝලයාදැයි සැක පහළවන තරමටම ඔහු ක්‍රිස්තු සභාවේ විරෝදාර සටන්කාමියකු ලෙස කැපී පෙනුණි.

**- ගුරුහරු -**

*9 වන පිටුවෙන්*

*කුරුසියේ ප්‍රේමය ලිපියෙහි ඉතිරි කොටස*

කුරුසිය යනු නත්තල් කතාවේ උච්චතම අවස්ථාවයි. රෙදි කඩකින් ඔතා සිටි ඒ බිළිඳාම, අපගේ අපරාධ නිසා උන්වහන්සේගේ දෑත් සහ පාද ඇණ ගැසීමට ලක් වූ ඒ ගැලවුම්කරුවාමය. උන්වහන්සේගේ උපත, අපගේ පාපයේ සහ ලැජ්ජාවේ බර දරාගත් උන්වහන්සේගේ කුරුසිපත් වීම දෙසට කෙලින්ම යොමු කරයි.




යොහාන් පොතේ, බයිබලයේ ඇති ප්‍රේමනීයම පදයෙන් මෙම ශ්‍රේෂ්ඨ, මුදවාගැනීම අලංකාර ලෙස විග්‍රහ කරයි: **"මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේමකළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාග න්න සෑමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය" (යොහාන් 3:10).** මෙම "දීම" උපතේදී ආරම්භ වූ අතර, උන්වහන්සේගේ අවසාන හුස්ම සමඟ කුරුසියේදී අවසන් විය, එමගින් උන්වහන්සේ කෙරෙහි විශ්වාස කරන සියල්ලන්ට සදාකාල ජීවනය ලබා දුන්සේක.

අපි නත්තල ගැන මෙනෙහි කරන විට, ගවලෙනේ සහ කුරුසියේ රූප එකට හිතේ තබා ගනිමු. අප තවමත් පව්කාරයන්ව සිටියදී, ක්‍රිස්තුස්වහන්සේ අප උදෙසා මිය යාමෙන්, දෙවියන්වහන්සේ අප කෙරෙහි ඇති තම ප්‍රේමය පෙන්වූ බව රෝම 5:8 අපට සහතික කරයි.

නත්තලේ සැබෑ ආශ්චර්යය නම්, මහිමයේ රජු මනුෂ්‍ය ඉතිහාසයට පා තබා, අපගේ මාංසය පැළඳගෙන, තම පරිපූර්ණ, පව් රහිත ජීවිතය මිදීමේ මිලයක් ලෙස පූජා කිරීමේ එකම අරමුණ ඇතිව පැමිණීමයි. උත්සවශ්‍රීයෙන් බැබළෙන නත්තල් සමයේදී, අපට සදාකාලිකව ජීවත් වීමට හැකි වන පිණිස මිය යාමට උපත ලැබූ ගැළවුම්කරුවාණන් ගැන වඩාත් සිතමු.

උන්වහන්සේ පැමිණියේ අපට සදාකාල ජීවනය ලබා දෙනු පිණිස බව මෙනෙහි කරමු. ගව මඩුවේ උපත ලද බිළිදා දෙස නොව කුරුසියේ මැරුණ අප ගැලවුම්කරුවාණන් දෙස බලමු.

යේසු පිහිටයි !

**- ශෂිලා ද සිල්වා -**

# කුඩා දේ සලකන දෙවියන්වහන්සේ
## (The God of Small Things)

අප දැනට දන්නා තොරතුරු අනුව මේ විශ්වය සිතීමටවත් බැරි ලෙස අති විශාලය. එහි විෂ්කම්භය ආලෝක වර්ෂ බිලියන 93 පමණ යැයි සැලකේ. මන්දාකිණි ට්‍රිලියන දෙකක් පමණ තිබේ. ඒ හැම එකකම තාරකා බිලියන ගණනක් ඇත. අපේම ක්ෂීරපථයෙහි තාරකා බිලියන 100 ක් පමණි. පෘතුවියේ සිට සූර්යයාට දුර කි.මී. මිලියන 150 කි.

මේ තරම් විශාලව හා සංකීර්ණව තිබුණත් විශ්වය යනු අවුල් සහගත පාලනයකින් තොරව අහඹු ලෙස ක්‍රියා කරන පද්ධතියක් නොවෙයි. එය ඉතාමත් ආශ්වර්යමත් ලෙස ඉතා නිරවද්‍යව ක්‍රියා කරන පද්ධතියකි. මන්දාකිණි, තාරකා, ග්‍රහලෝක යනාදී සෑම දෙයක්ම ඉතාමත් නිර්වද්‍යව එකිනෙකට සම්බන්ධ වී ක්‍රියා කරයි. කුඩා පරමාණුවේ සිට දැවැන්ත තාරකා දක්වා හැම එකක්ම භෞතික විද්‍යාවේ නියමයන්ට අනුකූලව ක්‍රියා කරයි. කිසිම දෙයක් දෙවියන්වහන්සේගේ පාලනයෙන් තොරව හිතුමතේ ක්‍රියා නොකරයි. මෙයින් කියවෙන්නේ දෙවියන්වහන්සේගේ විශාලත්වයයි. විශාල දේ සලකන එම දෙවියන්වහන්සේම කුඩා දේවල්ද නොසලකා හරින්නේ නැත. ගේ කුරුල්ලෙකුගේ පොළොව මතට වැටීම පවා දෙවියන්වහන්සේ දකින සේක. අපගේ හිසකෙස් පවා උන්වහන්සේ ගණන් කර තිබේ. අපගේ සියලුම යාච්ඤා දෙවියන්වහන්සේ ඉතාමත් අනර්ඝ ලෙස සලකන සේක. යාච්ඤා කරන පුද්ගලයා හෝ යාච්ඤාවේ වචන ප්‍රමාණය හෝ යාච්ඤා කරන්නේ කුමන දෙයක්ද යන්න වැදගත් නොවේ. ඉතාම සුලු දෙය පවා දෙවියන්වහන්සේ සලකන සේක.

මට වයස 11 දී පමණ ඇති වූ සිදුවීමක් සඳහන් කිරීමට කැමැත්තෙමි. අප සිටි නිවසේ සිට යාර 5ක් පමණ දුරකින් තමයි ක්‍රීඩා පිටිය තිබුණේ. එහෙත් එහි ගොස් ක්‍රීඩා කිරීමට අපේ තාත්තාගෙන් අපට අවසර තිබුණේ නෑ. ඔහු එම නීතිය ඉතාම තදින් ක්‍රියාත්මක කළා. ඒ කාලයේදී ලැබුණු දඬුවම් හිතා ගැනීමටවත් බැරි තරම් දරුණුය.

එහෙත් එක් දිනක් දවල් කාලයේ මාත් මගේ සහෝදර සහෝදරියන් සහ අස්ල්වැසි නිවෙස් වල ළමයින් කිහිප දෙනෙකු සමඟ අප ක්‍රීඩා පිටියට ගියා. නිවසේ දොර වසා දමා යතුර තිබුණේ මගේ සාක්කුවේ නමුත් ටික වෙලාවකින් යතුර නැති බව මට දැනුණා. මුළු ශරීරය පුරාම ගින්දර පිටවෙන්න පටන් ගත්තා. වැරදි දෙකකි. යතුර නැති වීම සහ පිට්ටනියට යාම. තත්වය කොයි තරම් බරපතළද යන්න අසල්වැසි ළමයින්ද දැන සිටි නිසා හැමදෙනාම, ළමයින් 10 ක් පමණ ඉතා සීරුවෙන් යතුර සෙව්වා. බොහෝ වේලාවක් ගත වුණා. අවසානයේ මා අක්කාට කතා කරලා කිව්වේ එකම එක දෙයයි කරන්න තියෙන්නේ. එනම් යාච්ඤා කිරීම. හැමෝම එකතු වෙලා යාච්ඤා කළා. ඒත් බය වැඩි කමට හැමෝම යාච්ඤාවට වඩා යතුර හෙව්වා. යතුර නැති වුනේ මගේ අතින් නිසා වැඩි බය තිබුණේ මටයි. කොතරම් හෙව්වත් යතුර ලැබුණේ නෑ. එකම පිළිතුර දෙවියන්වහන්සේ පමණක් බව මා මුළු සිතින්ම විශ්වාස කළා. අනිත් අය දිගටම යතුර හොයන අතර මා හත්වතාවක් විතර විටින් විට නොකඩවාම යාච්ඤා කළා. හැමෝගේම සෙවීමට වඩා දෙවියන්වහන්සේ කෙරෙහි මා තුළ විශ්වාසයක් තිබුණා. අවසාන වතාවට

යාච්ඤා කර මා නැගිට හැමෝම ගමන් කළ කුඩා පාරට ගියවිට පාර අයිනේ යතුර වැටී තිබුණා. හැමදෙනාම පුදුම වුණා. මන්ද හැම දෙනාම එම ස්ථානයේ යතුර සොයමින් ගමන් කර තිබුණත් එය දුටුවේ නැත. එය මටම සම්බ වුණා. කුඩා දේවල් ගැනද සලකන දෙවියන්වහන්සේ ක්‍රියා කරන්නේ ඒ ආකාරයටයි. මෙය අහඹු සිදුවීමක් නොවේ. සැබෑ ලෙසම යාච්ඤාවට පිළිතුරු ලැබීමකි.

මීට වසර දෙකකට පමණ පෙර නැවත වතාවක් මගේ යතුරු දෙකක් නැති වුණා. ඒ කැනඩාවේදීය. මගේ මෝටර් රථයේ සහ නිවසේ ප්‍රධාන දොරේ යතුර. එම යතුරු දෙකම එකට අමුණා Key Tag එකක තිබුණේ. මෙය ඉතා විරල සිදුවීමක්. ශීත කාලය නිසා එළියේ හිම තිබුණා. මා හිම ඉවත් කරන අතරේ යතුර කොහේ හරි වැටී තිබුණා. නැවත හැමදෙනාම එකතු වෙලා සොයන්න පටන් ගත්තා. කෙසේ වෙතත් නිවසේ වාහනය පදවන මාර්ගය දෙපසම උස හිම ගොඩවල් තිබුණු නිසා එය සොයා ගැනීමට නොහැකි වුණා. හරියට පඳුරකට වැටුණු ඉඳිකටුවක් වගේ. ඊටත් වඩා අමාරු දෙයක් එය ඉලෙක්ට්‍රෝනික යතුරක් නිසා තව යතුරක් ගැනීම මිල අධික දෙයක්. දින කිහිපයක්ම අප ඉතා උන්නදුවෙන් ඒ අවට සෑම තැනකම සෙව්වා. අපට බලාපොරොත්තු අත් හැරීමට සිදු වුණේ මන්දයත් පහුවෙනිදා හිම ඉවත් කරන ට්‍රක් රථය ඇවිත් පාර දිගේම තිබූ හිම සියල්ලම සූරා ගෙනගොස් තිබූ නිසාය. ඊට අමතරව අපගේ Drive way එකේද තිබූ හිම ද සූරාගෙන ගොස් තිබුණා. එම ට්‍රක් රථ විශාල හා ශක්තිමත්ය. දින කිහිපයකින් පසු Key Tag එකේ ඉතා කුඩා කෑල්ලක් අපට පාර අයිනේ තිබී හමු වුණා. එය එතරම් පොඩි කෑලි වලට කැඩී තිබීම පුදුමයක් නෙමෙයි. මන්දයත් එම ට්‍රක් රථ ඉතා විශාල සහ ශක්තිමත් නිසා යකඩ පවා ඒ ආකාරයෙන් කුඩු වෙලා නම් යතුර ගැන මොන කතාද? හදිසියේම මට කුඩා කාලය මතක් වුණා. මෙතරම් කාලයක් අමතකව තිබූ සිදුවීම නැවත වරක් මගේ මතකයේ රැව් පිළිරැව් දුන්නා. මම නැවත යාච්ඤා කළා. කුඩා කල මා අත්දැක්ක සාක්ෂිය සඳහන් කරමින් නොකඩවාම එක දිගට දිනපතාම යාච්ඤා කළා. සමහර අය කිව්වා යතුරේ කෑලි හම්බවුනොත් පුදුමයි කියලා. තවත් අය කිව්වා එය හම්බවුනත් වැඩක් නෑ, ඉලෙක්ට්‍රොනික් සියල්ලටම හානි වෙලා තියෙයි කියලා. ඒත් මේ දේවල් මා සැලකුවේ නෑ. කුඩා කාලයේ වගේම නොකඩවාම යාච්ඤා කළා.

සති තුනක් පමණ ගෙවී ගියා. දිනක් මා රථය පදවාගෙන මගේ Drive way එකට හරවන්න හදනකොටම ඉදිරිපස යම් කලු පාට යමක් පාරේ වැටී තිබුණා. මා සමඟ රථයේ තව කෙනෙක් සිටියා. ඔහුත් පසුගිය සති කිහිපය පුරාම යතුර සෙවූ කෙනෙකි. ඔහු කීවා ඒක තමයි යතුර ගිහින් අරගන්න. යතුර සම්බ වුණා. කෙනෙක් ඇහුවා නම් මේ තරම් කාලයක් ගිහින් තද සීතලට අහුවුන යතුර වැඩ කරයිද? එක වතාවෙම මගේ පිළිතුර වූයේ වැඩ නොකරන යතුරක් දෙවියන්වහන්සේ නැවත සොයා දෙනවාද? එය වැඩ කරන බව මා තරයේ විශ්වාස කළා. මා මුලින්ම කළේ දෙවියන්වහන්සේට ස්තූති කිරීම. කුඩා කාලයේ වගේම අදත් මගේ යාච්ඤාවට පිළිතුරු දීම ගැන මුළු සිතින්ම මම දෙවියන්වහන්සේට ස්තූති කළා. කිසිම වෙනසක් නැතුව යතුර වැඩ කළා. ඉතාම පුදුම දෙය නම්, එම ස්ථානයේ කිහිපවතාවක්ම අප යතුර සොයා තිබූ නමුත් එම පාරේ නිතරම ලොකු කුඩා වාහන සහ දැවැන්ත ට්‍රක් රථ ගමන් කර තිබූ නමුත් යතුර එම ස්ථානයේදීම හමු වුණා. එමෙන්ම කිසිම වාහනයකින් හානියක් වෙලා තිබුණේද නැත. යතුර අමුණා තිබූ Key Tag වල කෑලි කිහිපයත් විටින් විට අපට හමුවුණා. මට නැවත කල්පනාවට ආවේ දෙවියන්වහන්සේ මෙම යතුර ලබා දුන්නා නම් එම දෙවියන්වහන්සේම ගෙදර යතුරත් නැවත නොදෙන්නේ ඇයි? තවත්

තත්පර කිහිපයකට පසුව අනික් යතුරද වෙනත් තැනක වැටී තිබී හමුවුණා. මම යාච්ඤා කළා, මටම යතුර හමුවුණා.

මෙයට මාස කිහිපයකට පෙර ඉතාම තද හිම වර්ෂාවක් තිබුණා. දිනක අප ඉරිදා සභාවට ගියා. මගේ යතුර පමණක් මම ගෙන ගියා. ගෙදර තිබූ අමතර යතුරු කැරැල්ල කිසිම දිනක අප ගෙනයන්නේ නෑ. එදා සභාවේ රැස්වීම් අවසානයේ රථය වෙතට අප යන විට අධික ලෙස හිම වැටෙමින් තිබුණා. කාර් එකේ දොර ඇරීමට යතුර ගන්න සාක්කුවට අත දැමුවා. පුදුම ලෙස යතුර නැති වී තිබුණා. අපි සෑම තැනම යතුර සෙව්වා. නැවත සභා ගොඩනැගිල්ලට ගොස් සෙව්වා. ඒත් යතුර නැති වෙලා. නැවත වරක් ඉතාම පුදුම කරුණක් නම් කිසිම දවසක අතිරේක යතුරු කැරැල්ල නොගෙන යන අපි එදින මටත් නොදැනිම මගේ බිරිඳ එම යතුරු කැරැල්ල ගෙනැවිත් තිබුණා. ඇය එසේ කළේ ඇයි දැයි අද වන තුරුත් පැහැදිලි කළ නොහැකි දෙයකි. එය එසේ නොවුණා නම් රථය එතන දමා නිවසට යන්න තිබුණා. ඒත් දෙවියන්වහන්සේ අප කෙරෙහි කරුණාවෙන් ක්‍රියා කළා. දිගින් දිගටම අපි යතුර සෙව්වා සභාව බලාග න්නා අයටත් දැනුම් දුන්නා. යතුර ලැබුනේ නෑ. නැවතත් මට කුඩා කාලය මතක් විය. මම නැවතත් යාච්ඤා කළා. මම දෙවියන්වහන්සේට කිව්වේ මගේ සාක්ෂිය ආරක්ෂා කර දෙන ලෙසයි. මාස දෙකක් ගෙවී ගියා. එසේ අප දිගටම යාච්ඤා කළා. මගේ බිරිඳත් පසු ගිය සිදුවීම් දෙකම දන්නා නිසා දිගටම යාච්ඤා කළාය.

මාස දෙකකට පසු ඉරිදා නමස්කාර දේව මෙහෙයෙන් පසු මම පුතාට කිව්වා අද සභාවේ මිදුලේ අපේ යතුර හොයමු කියලා. තවම සුදු පාට හිම එළියේ තැන තැන ගොඩ ගහලා තිබුණා. මාස දෙකක් පුරාවට බොහෝ රථවාහන ඇවිත් ගොස් තිබුණා. මමත්, බිරිඳත් විශාල හිමෙන් වැසුනු ප්‍රදේශ පරික්ෂා කිරීමට පටන් ගත්තා. විනාඩි දෙකක් පමණ ගත විය. මගේ බිරිඳ යතුර පෙන්වමින් ඒ දෙසට ගමන් කළා. අඩි 5 ක් පමණ උස හිම ගොඩක් උඩ ඒ තුළට කිඳා බැස, යාන්තමට උඩට පෙනෙන පරිදි යතුර තිබුණි. පුදුම දෙය නම් මාස දෙකක් ගත වී තිබූ බැවින් එය තිබිය යුත්තේ හිම ගොඩ යට පොළොව මත වුවත් එය තිබුණේ හිම ගොඩ මුදුණේය. හරියටම එවෙලේ යමෙක් ගෙනවිත් ප්‍රවේශමෙන් ඒ මත තැබුවා වාගෙයි. ඒ වනවිටත් හිම පතිත වෙමින් තිබුණි. එම සිදුවීම පිදුරු ගොඩේ ඉදිකටුවක් හමුවීමටත් වඩා අමාරු දෙයක් විය. ඒ විදිහටම අඩි පහක් පමණ උසට මුලු Parking lot එක වටේම විශාල ප්‍රදේශයක් පුරාම හිම තිබුණා. එමෙන්ම විටින් විට එසේ ගොඩ ගැහෙන හිම ට්‍රක් වලින් වෙනත් ස්ථානවලට ඉවත් කරනවා. ඒත් ඉතා පුදුම ලෙස අපට පහසුවෙන් පෙනෙන තැනක යතුර හිම ගොඩක් මුඳුනේම තිබුණා.

යමෙක් සිතයි මේවා අහඹු සිදුවීම් කියා. යතුරක්, තුන් වතාවක්, එකම පුද්ගලයෙක්, සම්භාවිතාවය ඉතා සුළුයි. අතිශයෙන් කුඩායි. කෙසේ වෙතත් දෙවියන්වහන්සේ යාච්ඤාවට පිළිතුරු දුන්නා හැර වෙන කිසිවක් සිදු වූයේ නැත.

විශාල දේවල් මෙන්ම කුඩා දේවල් සලකන දෙවියන්වහන්සේ ක්‍රියා කරන්නේ ඒ ආකාරයටයි. අපගේ සෑම යාච්ඤාවම දෙවියන්වහන්සේ ඉදිරියේ අනර්ඝයි. ඇදහිල්ලේ නොකඩවාම යාච්ඤා කිරීම තමයි අප කළ යුත්තේ. දෙවියන්වහන්සේ මාගේ ජීවිතයේ කළ මෙවැනි ඉතාමත් පුදුම දේවල් බොහෝමයක් තිබෙනවා. විශ්වාස කළ නොහැකි තරමට ඒවා පුදුම සහගතයි.

**- ඇලෙක්ස් පෙරේරා -**

මෙම නත්තලේදී ක්‍රිස්තියානි මව්වරුන්ට ඇමතුමක්

# විවර්ණ නොවන වර්ණ

සිසිල් සුළඟ හමන, උදුවප් මාසයේ රාත්‍රීන්හි ගෙවල් වල විදුලි පහන් වෙනදාටත් වඩා රෑ එළි වන තුරු දැල්වේ, නත්තල් මාසයේ ලැයිස්තු දිගු වේ. කිතුණු කාන්තාවන් ලෙස, මෙම කාලය බොහෝ විට අපව දකින්නේ, ඉන්ද්‍රජාලික වාතාවරණයක් නිර්මාණය කිරීමේ ඉල්ලීම් සහ අපගේ පවුලේ ඇදහිල්ල පෝෂණය කිරීමේ ගැඹුරු කැඳවීම අතර සමබරතාවයක් පවත්වාගෙන යන අයුරිනි. සැරසිලි සහ කලබලය අතර අතරමං වීම පහසුය. නොදැනුවත්වම ක්‍රිස්තුස්වහන්සේගේ නොනැසී පවතින ආලෝකය වෙනුවට ලෞකික දේ වල ක්ෂනික ආකර්ෂණය කෙරෙහි අවධානය යොමු වෙයි. මෙම නත්තලේදී, අපි යේසුස්වහන්සේ කෙරෙහි අපගේ හදවත් යොමු කරමු. සැබෑ බයිබලීය සුන්දරත්වය මූර්තිමත් කරමු. අභිප්‍රායෙන් හා කරුණාවෙන් යුතුව අපගේ දරුවන්ව ගව ඔරුව වෙතටත් එතැනින් කුරුසිය වෙතටත් මඟපෙන්වමු.

සැබෑ සුන්දරත්වය හදවතේ පිළිඹිඹුවක් බව සැබෑවකි. හදවතේ කැඩපත මුහුණයි. බාහිර පෙනුමෙන් උමතු වූ සංස්කෘතියක් තුළ, කාන්තාවකගේ සැබෑ සුන්දරත්වය කුමක්ද යන්න පිළිබඳ ශුද්ධ බයිබලය පෙන්වා දෙයි. එය පරිපූර්ණ, අලංකාර, මිල අධික ඇඳුමෙන් හෝ විසිතුරු සැරසිලි වලින් සොයාගත නොහැක. නමුත් ඇගේ අභ්‍යන්තර ආත්මයේ කල් පවතින ගුණාත්මක භාවය තුළ එය මනාවට පිළිඹිඹු වේ.

පේත්‍රුස් මේ පිළිබඳ සෘජුවම කතා කර කාන්තාවන්ට මෙසේ අවවාද කරයි. " **නුඹලාගේ අලංකාරවීම හිසකේ ගෙතීමද ස්වර්ණාභරණ පැළඳීමද නොහොත් වස්ත්‍ර ඇඳීම ද යන පිටත අලංකාරය නොව, දෙවියන්වහන්සේ ඉදිරියෙහි ඉතා අනර්ඝව තිබෙන මෘදු වූ, නිශ්චලවූ ගතියක් නැමැති දිරා නොයන සැරසීමෙන් යුක්ත වූ සිතේ ඇතුල් මනුෂ්‍යයා වේවා" (1 පේත්‍රුස් 3:3-4).**

මෙම "නොනැසී පවතින සුන්දරත්වය" ක්ෂය නොවේ, එය බලවත්ය. මොළොක් සහ නිශ්ශබ්ද ආත්මයක් පැමිණෙන්නේ දෙවියන්වහන්සේගේ ප්‍රේමය තුළ සුරක්ෂිත වූ හදවතකින් වන අතර එය ලබා ගැනීම සඳහා වෙර දැරීමට හෝ අවට වාතාවරණය පාලනය කිරීමට අවශ්‍ය නොවේ. එය සෘතු ගෙවීයාමෙන් හා වසර ගණනාවක් එකතු වීමෙන් අඩු කළ නොහැකි සුන්දරත්වයකි. කරුණාව, නිහතමානීකම සහ දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය මගින් සංලක්ෂිත මෙම අභ්‍යන්තර ආභරණය අප පැළ කරන විට අපි උන්වහන්සේගේ ප්‍රේමයේ ජීවමාන පිළිඹිබු බවට පත්වෙමු. අපගේ නිවෙස් වල ප්‍රධාන ප්‍රේමණීය ආදර්ශය හා දෙවියන්වහන්සේගේ වචනය පවුල

තුළ පැවැත්මක් ඇති දෙයක් බවට පත් කරන තැනැත්තා බවට පත් වෙමු.

**හිතෝපදේශ 31:30** මෙම මූලධර්මය අලංකාර ලෙස සාරාංශ කරයි. **"රූපශ්‍රීය රැවටිලි සහිතය, ශෝභන කම නිශ්චලය ප්‍රශංසාව ලැබෙන්නේ ස්වාමින්වහන්සේ කෙරෙහි භය ඇති ස්ත්‍රියටය"** අපගේ වටිනාකම බාහිර මිණුම් වලින් නොව දෙවියන්වහන්සේ කෙරෙහි අප දක්වන ගෞරවයෙන් සහ උන්වහන්සේ අප තුළ ගොඩ නගන චරිතයෙන් අර්ථ දැක්වේ.



ලෞකික දේ වලින් ක්‍රිස්තුස්වහන්සේගේ පුදුමය වෙත අපගේ බැල්ම යොමු කිරීමේ මෙම ප්‍රමුඛතාවය ආදර්ශයට ගැනීමට නත්තල් සමය පරිපූර්ණ අවස්ථාවක් සපයයි. ලෝකය අපගේ අවධානය ලබාගැනීම සඳහා කෑ ගසයි. හොඳම තෑගි, පරිපූර්ණ පවුලේ ඡායාරූපය, විස්තීර්ණ ආහාර වේල්... මෙම දේවල් ස්වභාවයෙන්ම වැරදි නැත. නමුත් ඒවා නත්තලේ සැබෑ අර්ථය යටපත් කරන විට බාධක බවට පත් වේ.

අපි අපෙන්ම මෙසේ අසා ගනිමු. අපි වඩාත් සැලකිලිමත් වන්නේ අපගේ දරුවන්ගේ අලුත් සෙල්ලම් බඩුවක් පිළිබඳ උද්යෝගය ගැනද, නැතහොත් ක්‍රිස්තු උපතේ ආශ්චර්ය ගැන ඔවුන් දක්වන ගෞරවය ගැනද? අපි සෞන්දර්යාත්මක සතුට සඳහා නිවස අලංකාර කරනවාද, නැතහොත් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමයේ පූජාව ගැන අවධානය යොමු කරන පරිසරයක්, කතාබහක් නිර්මාණය කරනවාද?

යේසුස්වහන්සේ **"පොළොවෙහි නුඹලාට වස්තු රැස් කර නොතබන්න, එහිදී කාවෝද මළකඩ ද ඒවා නාස්ති කරති, සොරුද උමං කැන සොරා ගනිති" (මතෙව් 6:19-20).** එරෙහිව අනතුරු ඇඟවූ සේක. මෙම නත්තලේදී, සදාකාලික වස්තු සඳහා ආයෝජනය කිරීමට අපට අද්විතීය අවස්ථාවක් තිබේ. ඒ නිසා කුඩා හදවත් ගැලවුම්කරුවා වෙත මඟපෙන්වීම අවශ්‍ය වේ.

මව්වරුන් ලෙස, අපි අපගේ දරුවන්ගේ හදවතේ වැඩි ආදරයක් දිනා සිටින්නන් වෙමු. ඒ නිසා අපි ඔවුන්ගේ දෑස් බෙත්ලෙහෙමේ තාරකාව දෙසට යොමු කළ හැකි මාර්ගෝපදේශකයන් වෙමු. මේ පුංචි හදවත් යේසුස්වහන්සේගේ ප්‍රේමයෙන් පුරවන්නන් වෙමු. නත්තලට දරුවන්ට තෑගි ගැනීමට කාලය ගත කරනවාට වඩා නත්තලේ සැබෑ කතාව ඔවුන්ට කියා දෙන්නට කාලය සොයා ගනිමු.

කතාවට ප්‍රමුඛත්වය දෙන්න. දරුවන් සමඟ කතා කරන්න. ලූක් ශුභාරංචියේ

නත්තල් කතාව කියවීමට දිනපතා කාලය ගන්න. නත්තල කියන්නේ ලෝකය ඔවුන් ඉදිරියේ මවන පාට පාට මායා ලෝකයක් නොවන බව කියා දෙන්න. නත්තලේ සරල සත්‍යය තරඟකාරී වෙළඳ දැන්වීම් වල ඝෝෂාවෙන් යටපත් කිරීමට ඉඩ නොදෙන්න.

ලැබීමට වඩා දීම අවධාරණය කරන්න. "ලබාගැනීමේ ලැයිස්තුව" සිට "දීමේ ලැයිස්තුව" දක්වා ඔවුන්ගේ සිතුවිලි මාරු කරන්න. ඔබ තෑගි දෙන්න කැමති, අවශ්‍යතාවයක් ඇති දරුවෙකුට තෑගි පෙට්ටියක් ඇසුරුම් කිරීම හෝ ඔබට යම් උදව්වක් කිරීමට ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වීම වැනි දේ වලට දරුවන් සම්බන්ධ කර ගන්න. නත්තලේ හදවත පරිත්‍යාගශීලී ප්‍රේමය බව ඔවුන්ට කියා දෙන්න.

පුද්ගලිකව දෙවියන්වහන්සේ සමඟ ගත කරන කාලය අගය කරන්න. අවුල් සහගත තත්වය මධ්‍යයේ, නිස්කලංක මෙනෙහි කිරීම සඳහා ඉඩක් නිර්මාණය කරන්න. ප්‍රශංසා ගී ගයන්න, එක්ව යාච්ඤා කරන්න සහ ගව ඔරුවක උපන් රාජ කුමාරයාගේ නිහතමානීකම ගැන කතා කරන්න.

යේසුස්වහන්සේට ප්‍රමුඛත්වය දීමට තෝරාගැනීමෙන්, අපි ශුද්ධ වූ බයිබලය කියවීමට කාලය ලබා දෙමින්, විනෝදකාමී සාදයකට වඩා සේවයට ප්‍රමුඛත්වය දෙමින්, නත්තල් සමය ගත කිරීම පමණක් නොව අපි ඇදහිල්ලේ උරුමයක් ගොඩනගමු. අපගේ දරුවන් අපව දකින විට ඔවුන් සැබවින්ම වැදගත් දේ ඉගෙන ගනී.

මෙම නත්තල් සමයේදී දෙවියන්වහන්සේට



කැපවූ හදවතක නොමැකෙන ආභරණය වැළඳගනිමු. මෙම ආභරණයේ වර්ණ ලෞකික වූ අවිරශ්මියෙන් විවර්ණ වීමට ඉඩ නොදෙමු. එසේ කිරීමෙන් අපි ශුද්ධ ලියවිල්ලේ විස්තර කර ඇති අතිශය අලංකාරය විහිදුවනවා පමණක් නොව ලෞකික බාධක මධ්‍යයේ අපගේ දරුවන්ට ඵලදායි ලෙස මඟපෙන්වමු. සියල්ලටම වඩා උතුම් ත්‍යාගය වන අපගේ ගැළවුම්කරුවානන්ගේ පාමුලට ඔවුන්ව ගෙන යමු.

යේසු පිහිටයි !

**- ශෂිලා ද සිල්වා -**

# 2026 නව වසර ඔබ සැමට දෙවියන්වහන්සේගේ ආශිර්වාදය, කරුණාව, අනුග්‍රහය බහුල

# නව වසරක් වේවා !

## නව වසරේ අභියෝග

- ★ දිනපතා බයිබලය පිළිවෙලින් කියවමු.
- ★ වඩ වඩා දෙවියන්වහන්සේට කතා කරමු.
- ★ සෑම ඉරු දිනකම සභාවට යමු.
- ★ සතුටු සිතින් දෙවියන්වහන්සේට පූජා කරමු.
- ★ එකිනෙකා ඇදහිල්ලෙන් ශක්තිමත් කරමු.
- ★ අපට වරද කරන අයට නිතර සමාව දෙමු.
- ★ අපේ දරුවන්ට දෙවියන්වහන්සේ පිළිබඳ කියා දෙමු.
- ★ එකිනෙකාට හැකි පමණින් උපකාර කරමු.

www.christianfellowshipcentre.com

Cfc Colombo (Christian Fellowship Centre)

CFC Colombo


**ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය**

අංක - 07, විවේකානන්ද පාර,

වැල්ලවත්ත,

කොළඹ 06.

දුරකථන අංක : 011 2 581 901 / 077 8 813 197

www.christianfellowshipcentre.com



NMA GRAPHICS

No. 246/1, Galle Road, Ratmalana.

Tel: 011 2 730 644 / 071 4 286 295 / 077 4 223 020

E-mail : nmagraphics2001@gmail.com